තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය
இளைஞர் விவகார மற்றும் விளையாட்டு அமைச்சு
Ministry of Youth Affairs and Sports

නො.09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07.
இல. 09, பிலிப் குணவர்த்தன மாவத்தை, கொழும்பு 07.
No.09, Philip Gunawardana Mawatha, Colombo 07.

මගේ අංකය / எனது இலக்கம் / My No.
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date

MOYS/MED/2025/73 I

2026.03.04

මාධ්‍ය නිවේදනයයි

**ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනැගීම වෙනුවෙන් Youth Link Sri Lanka වැඩසටහන වසර පුරා පැවැත්වීමට සැලසුම් කර තිබෙනවා....! - තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය දිනිඳු සමන් හෙන්නායක**

**Youth Link Sri Lanka වැඩසටහන ආරම්භය හෙට (05දා) මඩකලපුවේ දී**

ජාතික තරුණ සේවා සභාව සංවිධානය කරන Youth Link Sri Lanka වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීමේ මාධ්‍ය හමුවක් අද (04දා) ජාතික තරුණ සේවා සභාවේදී පැවැත්විය.

මාධ්‍ය හමුවට සහභාගී වූ තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය දිනිඳු සමන් හෙන්නායක මහතා පැවසුවේ ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනැගීමේ අභියෝගය ජය ගැනීම වෙනුවෙන් Youth Link Sri Lanka වැඩසටහන කදිම ප්‍රවේශයක් බවයි. අභියෝග බාරගත හැකි තාරුණ්‍යයක්, සහකම්පනය සහිත තරුණ ප්‍රජාවක් නිර්මාණය කිරීම වෙනුවෙන් මෙවැනි වැඩසටහන් තුළින් විශාල දායකත්වයක් දක්වන බව ද නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් සඳහන් කළේය.

වත්මන් තාරුණ්‍යයට නිවැරදි දිශානතිය පෙන්වීමේ වගකීම සහිත ප්‍රමුඛතම ආයතනය ලෙස ජාතික තරුණ සේවා සභාවේ මැදිහත්වීම අගය කරන බවද නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කළේය. පටු දේශපාලන අරමුණු පරාජය කිරීම වෙනුවෙන් ආගම්, ජාති, කුල භේදයකින් තොරව සියලු ශ්‍රී ලාංකිකයන් ස්වීකරණය වීම අවශ්‍ය බවත් නියෝජ්‍ය අමාත්‍යවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

ජාතික තරුණ සේවා සභාව සංවිධානය කරන Youth Link Sri Lanka වැඩසටහන හෙට (05දා) පස්වරු 1.30ට මඩකලපුවේදී ආරම්භ වීමට නියමිත බව ජාතික තරුණ සේවා සභාවේ සභාපති/ අධ්‍යක්ෂ ජෙනරාල් නීතිඥ සුපුන් විජේරත්න මහතා පැවසීය. ඒ අනුව ගම්පහ අනුරාධපුර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල තරුණ තරුණියන් මඩ කලපුව දිස්ත්‍රික්කය තුළ ස්ථාන තුනක නවාතැන් ගැනීමට නියමිත බවද ඔහු ප්‍රකාශ කළේය.

එමෙන්ම හෙට (05දා) දිනයේදීම පස්වරු දෙකට අම්පාර දිස්ත්‍රික්කය තුළදී ද මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිත අතර, ඒ අනුව මාතලේ සහ කුරුණෑගල තරුණ තරුණියන් අම්පාර දිස්ත්‍රික්කය වෙත යාමට නියමිත බව ද සභාපතිවරයා විසින් සඳහන් කළේය.

ඒ අනුව Youth Link Sri Lanka වැඩසටහනේ මුල් අදියර හෙට දිනයේදී ආරම්භ වන අතර , එහිදී උතුරු පළාතේ දිස්ත්‍රික්ක පහක්, නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්ක තුනක් හා මහනුවර, නුවරඑළිය, බදුල්ල යන දිස්ත්‍රික්ක මූලික කර ගනිමින් වැඩසටහන් 20ක් ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත.

මෙම දේශීය තරුණ හුවමාරු වැඩසටහන "Connect - 2026 Youth Clubs" යටතේ ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේ ලියාපදිංචි යෞවන සමාජ ආශ්‍රිතව ක්‍රියාත්මක වේ. දින හයක වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක වන මෙම වැඩසටහන සඳහා වයස අවුරුදු 18ත් 29ත් අතර තරුණ තරුණියන් දෙසීයකට ආසන්න පිරිසක් සහභාගී වීමට නියමිතය.

වැඩසටහනේ පළමු අදියර මැයි මාසයේ දී අවසන් වේ. වැඩසටහනේ දෙවන අදියර මැයි මස පළමුවැනිදා ආරම්භ වී සැප්තැම්බර් 3 වැනිදායින් අවසන් වීමට නියමිතව ඇත.

දුරකථන / தொலைபேசி / Telephones - 0112697934
ෆැක්ස් / தொலைநகல் / Fax - 0112688836
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail - secofsports@gmail.com, secretary@moys.gov.lk
වෙබ් / இணையதளம் / Web - www.moys.gov.lk

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය
இளைஞர் விவகார மற்றும் விளையாட்டு அமைச்சு
Ministry of Youth Affairs and Sports
නො.09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07.
இல. 09, பிலிப் குணவர்த்தன மாவத்தை, கொழும்பு 07.
No.09, Philip Gunawardana Mawatha, Colombo 07.

මගේ අංකය / எனது இலக்கம் / My No.
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date

මීට අදාළ සවිස්තරාත්මක මාධ්‍ය නිවේදනය සහ වැඩසටහන් විස්තරය මේ සමඟ යොමු කර ඇත. මෙම වැඩසටහන් සඳහා ඔබගේ ආයතනයේ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් යොමු කරන ලෙස ද මෙයින් ඉල්ලා සිටිමු.

අපගේ මාධ්‍ය කටයුතු වෙනුවෙන් ඔබ දක්වන සහයෝගයට ස්තුතියි.

මීට අදාළ ඡායාරූප මේ සමඟ යොමු කර ඇත.

මාධ්‍ය අංශය
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

දුරකථන / தொலைபேசி / Telephones 0112697934
ෆැක්ස් / தொலைநகல் / Fax 0112688836
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail secofsports@gmail.com secretary@moys.gov.lk
වෙබ් / இணையதளம் / Web www.moys.gov.lk